# ථේරවාද හා මහායාන ජාතක කථා සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක් (පාලි ජාතකට්ඨකථාව හා ආර්යශූරගේ ජාතකමාලාව ඇසුරින්)

අඹගස්පිටියේ සෝභිත හිමි[1]

## හැඳින්වීම

'ජාතක' නමැති පාලි ශබ්දයෙන් අර්ථවත් කරනුයේ උත්පත්තියයි. බුදුරජාණන් වහන්සේ විසින් අතීත භවයන්හිදී දාන, ශීලාදී දශ පාරමිතා වශයෙන් පූර්ණත්වයට පත් කරන ලද කථාවස්තු ඇතුළත් විවරණ පෙළ ජාතක යන නාමයෙන් හැඳින්වේ. බෞද්ධ සාහිත්‍යයේ ථේරවාද සම්ප්‍රදාය හා මහායාන සම්ප්‍රදාය යන සම්ප්‍රදා ද්වයෙහි ම ජාතක යන්න විද්‍යමාන වේ. ථේරවාද පාලි ත්‍රිපිටකයේ සූත්‍ර පිටකාගත ඛුද්දක නිකායට අයත් දස වන ග්‍රන්ථය ජාතක පාලියයි. එහි ඇතුළත් වන්නේ ජාතක උදෙසා උපස්ථම්භක වූ බුදුරදුන් විසින් දේශිත ගාථා පමණි. උන්වහන්සේ විසින් ඒ ඒ අවස්ථාවන්හි ඒ ඒ පුද්ගලයන් අරභයා දේශනා කරන ලද ජාතක කථාවන්ට අයත් තේමා ඇතුළත් ගාථා සමූහය එක්හාසු කොට ජාතකපාළිය සම්පාදනය කර ඇත. එම ජාතකපාළියට අයත් ගාථා උදෙසා වර්ණනා සපයනු වස් ක්‍රි.ව. 05වන සියවසේ ලක්දිවට පැමිණි අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විසින් සම්පාදිත ජාතකට්ඨකථාව වනාහි ජාතක කථා 547කින් සමන්විත ග්‍රන්ථයකි. මෙහි විද්‍යමාන ජාතක ප්‍රමාණය සම්බන්ධයෙන් විවාදාපන්න මත රැසකි. 550ක් ජාතක තිබෙතැයි ලංකාව, බුරුමය හා සියමය වැනි සාහිත්‍ය සම්ප්‍රදායන්හි පිළිගත්ත ද ජාතකට්ඨකථාවෙහි අන්තර්ගත වනුයේ ජාතක 547ක් පමණි. ජාතක කථා පිළිබඳ තොරතුරු ඇතුළත් වන ත්‍රිපිටක මූගාශ්‍රය රැසක් හමු වේ. ඒ අතර සූත්‍ර හා විනය පිටකයන්හි බොහෝ තැන් කිහිපයක ම ජාතක පිළිබඳ තොරතුරු අනාවරණය වේ. මෙම ථේරවාද ජාතකපාළිය හා බුරුම බෞද්ධ කථාවන් ද මූලාශ්‍රය කරගෙන බෞද්ධ සංස්කෘත මහායාන ග්‍රන්ථාවලියට අයත් ජාතකමාලා නමැති ග්‍රන්ථය සම්පාදනය වී ඇත. මෙහි කතුවරයා වන්නේ ආර්යශූරපාද නමැති ගිහි පඬිවරයෙකි. තාරානාථයන්ගේ තිබ්බතීය ලේඛන හා ස්පේයර් මහතාගේ කාලනිර්ණය මෙන්ම ඉත්සිං භික්ෂුවගේ දේශාටන වාර්තාවලට අනුව මොහු කාලිදාස විසූ සියවස වන ක්‍රි.ව. තෙවන හෝ සතර වන සියවසට අයත් වූවෙකැයි පිළිගැනේ. ජාතකමාලාවෙහි ම දැක්වෙන පරිදි ආර්යශූරගේ අධිෂ්ඨානය වී ඇත්තේ ජාතක කථා 100ක් පමණ රචනා කිරීමටය. එසේ වුව ද ව්‍යාඝ්‍රී ජාතකයේ බෝසතුන් මෙන් ම පැටවකු සමග බඩසයින් සිටි වලස් දේනුවකට තම සිරුර පුදා ජීවිත දානය කළ බව මෙහි ද සඳහන් වේ. අශ්වඝෝෂ හා කාලිදාස ආදීන්ට අයත් පිරිසිදු, විචිත්‍රවත් සංස්කෘත භාෂාවෙන් ලියැවුණු මෙම අපූරු ග්‍රන්ථය හා පාලි ජාතකට්ඨකථාව යන ග්‍රන්ථ ද්වයෙහි ම පවත්නා සම-විශමතා මෙන් ම සාහිත්‍යාත්මක පසුබිම පිළිබඳ ව සංක්ෂිප්තව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

1 භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, ශ්‍රී ලංකාව.
Asobhitha90@gmail.com

**පර්යේෂණ ගැටලු**

ජාතකමාලාවේ හා ජාතකට්ඨකථාවේ අන්තර්ගත තේමාවන්ගෙන් ප්‍රකට කරනු ලබන්නේ කෙබඳු අර්ථයන් පදනම් වූ දිශානතීන් ද? සම්ප්‍රදායන් දෙකෙහි බෝධිසත්ව චරිත නිරූපණය එකිනෙකට වෙනස් වන්නේ කෙසේ ද? ජාතක කථාකරුවන් තම ආගමික අරමුණු ඉටුකර ගැනීමට භාවිත කළ උපක්‍රම කෙබඳු ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු වශයෙන් යොදා ගතිමි.

**පර්යේෂණ අරමුණ**

මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ ජාතකට්ඨකථාවේ හා ජාතකමාලාවේ පවත්නා සම විෂමතාවයන් කෙබඳු ද යන්න හඳුනා ගැනීමෙන් දාර්ශනික, චින්තනමය හා සාහිත්‍යයාත්මක මෙන් ම භාෂාමය සංධාරාවන් ඔස්සේ පුළුල් කථිකාවත් ගොඩ නගනු වස් මෙම ග්‍රන්ථ දෙක පිළිබඳව විමර්ශනාත්මකව මෙන්ම සංක්ෂිප්තව අධ්‍යයනය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ විධික්‍රමය භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. පාලි ජාතකට්ඨකථාව හා සංස්කෘත ජාතකමාලාව මුල් කරගත් මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාවිත කරනුයේ ඛුද්දක නිකායාගත ජාතකපාළිය හා ජාතකට්ඨකථාව මෙන් ම සංස්කෘත භාෂාවෙන් විරචිත ආර්යශූරපාදයන්ගේ ජාතකමාලාවයි. එමෙන් ම ද්විතීයික මූලාශ්‍රය භාවිතය, පුස්තකාල පරිහරණය කිරීම, අන්තර්ජාලය වැනි නූතන තාක්ෂණික ක්‍රම ඔස්සේ දත්ත ගවේෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හි මෙම විෂය සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් සහිත විද්වතුන් සමග සාකච්ඡා කිරීමට ද අපේක්ෂා කෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පාලි සම්ප්‍රදායට අනුව ජාතකට්ඨකථාවේ විග්‍රහ වන පරිදි ජාතක කථාවක අන්තර්ගත විය යුතු කොටස් 05ක් පමණ විද්‍යමාන වේ.

1. **පච්චුප්පන්නවත්ථු** :- වර්තමාන කථාව. බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයේදී කවර කාරණාවක් අරඹයා, කිනම් තැනකදී, කවරෙකු හට දේශනා කරන ලද්දේදැයි මෙමඟින් ගම්‍ය කරේ.

2. **අතීතවත්ථු** :- මෙහි බෝධිසත්ව චරිතය නිරූපණය වන ගද්‍යමය කථා වස්තුවක් දක්නට ලැබේ.

3. ගාථා :- ඛුද්දක නිකායේ ජාතකපාළියේ දක්නට ලැබෙන ගාථාවන් භාවිතයෙන් අතීත ස්තුවෙහි හෝ වර්තමාන වස්තුවෙහි අන්තර්ගතය ගෙනහැර දැක්වීමය.

**4. වෙය්‍යාකරණ** :- ජාතකපාළියේ තේමා වශයෙන් විද්‍යමාන වන එක් එක් ගාථාවෙහි එක් එක් පදයක් පාසා අර්ථ වර්ණනා කරන්නා වූ අර්ථ කතා ක්‍රමයයි.

**5. සමෝධාන** :- අතීත හා වර්තමාන කථා ද්වයෙහි සම්බන්ධය දැක්වීමයි. අතීත කතාවෙහි දැක්වෙන පුද්ගලයන් වර්තමාන කථාවෙහි කවුරුන් වෙත්දැයි සමෝධානයෙන් දක්වයි.

පාලි ජාතකට්ඨකථාවෙහි ව්‍යුහය මෙසේ වුව ද ජාතකමාලාවේ මෙවැනි ලක්ෂණයන් අදෘශ්‍යමාන වේ. ඇතැම් කථාවන්හි වර්තමාන වස්තුවක් දක්නට නො ලැබේ. අතීත වස්තුව පමණක් දක්නට ඇත. ගාථා වශයෙන් පාලියේ විද්‍යමාන ගාථාවන් ම සංස්කෘතයට නගා නොමැත. එමෙන් ම වෙය්‍යාකරණ ලක්ෂණ ද අදෘශ්‍යමානය. අතීත හා වර්තමාන වස්තුන්හි පූර්වාපරසන්ධි ගැලපීමක් ද ජාතකමාලාවේ අවිද්‍යමානය. මෙහි සෑම කථාවක් ම ආරම්භ වන්නේ ද අවසන් වන්නේ ද සදාචාරාත්මක හෝ දාර්ශනික උපදේශයක් ලබාදීමෙනි.

ග්‍රන්ථද්වය ම ආරම්භ වන්නේ තුණුරුවනට නමස්කාර කිරීමෙනි. එමෙන් ම කෘති දෙකෙහි ම බෝසතුන්ගේ බල පරාක්‍රමය හා වීරත්වය ආදි පාරමිතා ගුණ පිළිබඳව සාකච්ඡා කෙරේ. එයින් පැහැදිලි වන්නේ ථේරවාද සම්ප්‍රදායට අනුගතව ආර්යශූරපාදයෝ සිය ග්‍රන්ථය රචනා කළ බවයි. පාලි ජාතකට්ඨකථාවේ භාෂා ශෛලිය වනාහි සරල, සුමට, මිහිරි ශෛලියකි. ජනශ්‍රැති වශයෙන් ම පැවති බොහෝ කථා ජාතකට්ඨකථාවට මූලාශ්‍රය වීම එයට එක් හේතුවක් විය හැකිය. එමෙන් ම ගැඹුරු බස්වහරක් ජාතකට්ඨකථාවෙහි දක්නට නොමැත. එසේ වුව ද ජාතකමාලාව, මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ආභාසය ලබමින්, උසස් භාෂා සාහිත්‍යය, විචිත්‍රවත් සංස්කෘත කාව්‍යවිචාර මූලධර්ම ආදිය ද භාවිතයට ගනිමින් සම්පාදනය වූ ගැඹුරු බස් වහරක් සහිත කෘතියකි.

ග්‍රන්ථද්වයෙහි ම ගද්‍ය-පද්‍ය ලක්ෂණ අන්තර්ගත වන හෙයින් චම්පු කාව්‍ය ගණයට අයත් වේ. භාෂාව හා සම්ප්‍රදාය වෙනස් වුව ද කෘති දෙකෙහි ම මූලික අරමුණු හා තේමාවන් අතර සමානකම් දැකිය හැකිය. එනම් දාන, ශීල, නෛෂ්කර්ම්‍ය, ප්‍රඥා, වීර්යය, ශාන්ති, සත්‍යය, අධිෂ්ඨාන, මෛත්‍රී හා උපේක්ෂා යන දශ පාරමිතා බෝධිසත්වයන් වහන්සේ ප්‍රායෝගිකව පුහුණු කළ ආකාරය දැක්වීමයි. කෘති ද්වයෙහි ම දැක්වෙන පරිදි ගද්‍යයෙන් කථාවස්තුව ප්‍රකාශ කොට පද්‍යයෙන් උපදේශ හා දාර්ශනික සංකල්ප ඉදිරිපත් වේ. පාලි ජාතකට්ඨකථාව හුදෙක් සාහිත්‍යාත්මක ලක්ෂණයන්ගෙන් හෙබි ග්‍රන්ථයක් වශයෙන් රසවින්දනයට නැඹුරුව රචනා වූ ග්‍රන්ථයක් ආකාරයෙන් අර්ථකථනය කිරීම යුක්ති යුක්ත නොවේ. මෙමඟින් ආචාර ධර්ම හා සදාචාරාත්මක මඟ පෙන්වීම් ආදිය සමාජගත කෙරේ යැයි උපකල්පනය කළ හැකි ය. ජාතකමාලාවෙන් ද එම ධර්මයන් ම සාධනය කරන අතර සංස්කෘත කවි සමයට මූලිකත්වය ලබා දෙමින් බෝධිසත්ව චරිතය විචිත්‍රවත් අයුරින් වර්ණනාවට භාජනය කොට දාර්ශනික පසුබිමක් විශද කරන්නට උත්සාහ දරා ඇත.

ජාතකට්ඨකථාවේ දැක්වෙන බෝසත්හු සසරෙන් එතෙරව අන්‍ය සත්වයන් ද එතෙර කරනු වස් සත්‍ය ගවේෂණය උදෙසා පාරමිතා පූරණය කරන්නෙක් වශයෙන්

ප්‍රකට වේ. එසේ වුව ද ජාතකමාලාවෙහි දක්නට ලැබෙන්නේ බෝසතුන් අතිමානුෂීය, මහකරුණාවෙන් යුතු, මුළුමහත් විශ්වයේ ම දුක නිවීමට කැපවුණු **මහාසත්ත්ව** යන නාමයෙනි. ජාතකට්ඨකථාවෙහි විද්‍යමාන කථාවන්හි චරිත වනාහි හුදෙක් පොදු සමාජයේ ජනයා හා භික්ෂූන්ය. ජාතකමාලාවේ දක්නට ලැබෙන චරිත රජවරුන්, රාජ සභිකයින්, බමුණන් හා උසස් ධනේශ්වර උගතුන්ය. එමඟින් පැහැදිලි වන්නේ ජාතකමාලාව විෂයෙහි සංස්කෘත සාහිත්‍යාගත උසස් යැයි සම්මත බ්‍රාහ්මණ සමාජයේ බලපෑම නිරායාසයෙන් හිමිව ඇති බවයි.

ජාතකමාලාවේ ශ්ලෝක බන්ධනය උදෙසා අප්‍රසිද්ධ **මත්තමයූර, ප්‍රමිතාක්ෂර, භුජංගප්‍රයාත, ප්‍රහාරණකලිතා** හා **ප්‍රමාණිකා** වැනි වෘත්ත භාවිත කරනලදී. ජාතකට්ඨකථාවේ දැක්වෙන්නේ **වසන්තතිලකා, විද්‍යුන්මාලා, ඉන්ද්‍රවජ්‍රා, උපේන්ද්‍රවජ්‍රා, වංසට්ඨ** වැනි ප්‍රසිද්ධ වෘත්තයෝය. මහජනයාට කියවීමේ පහසුව ඇති කිරීම උදෙසා එවැනි වෘත්ත භාවිත කරන්නට ඇතැයි **රීස් ඩේවිඩ් පඬිතුමා** ප්‍රකාශ කරත්. එමෙන් ම අට්ඨකථාවෙහි ඇතැම් කථා ජනශ්‍රැතියට අනුගතව සැකසුණු හෙයින් ඒවායෙහි ග්‍රාම්‍ය ලක්ෂණ, සාමාන්‍ය මිනිසුන්ගේ දුබලතා මෙන් ම සරල අලංකාර භාවිතය ද දක්නට ලැබේ. සරල ව්‍යාකරණ රීති භාවිතය මෙහි ආවේණික අංගයකි. ආර්යශූර විසින් මෙම සියලු ක්‍රමයන් අභිභවා ගොස් ඕජෝ ගුණයෙන් ආකීර්ණ, අනුප්‍රාස බහුල, ව්‍යාකරණ රීතීන්ගෙන් ග්‍රහණ, රූපක ආදි විවිධ අලංකාර ප්‍රභේද යොදා ගෙන, සංස්කෘත කවි සමයට උචිත පරිදි ජාතකමාලාව රචනා කරන ලදි.

ජාතක මාලාවේ ජාතක කථා සියල්ල 34කි. ඉන් කථා 05ක් පමණ ජාතකට්ඨකථාවේ අවිද්‍යමාන කථාවෝය.

- ව්‍යඝ්‍රී ජාතකය
- මෛත්‍රීබල ජාතකය
- යඥ ජාතකය
- අපුත්‍රක ජාතකය
- හස්ති ජාතකය

යන ජාතක කථා ජාතකමාලාවට පමණක් ආවේණික කථා වශයෙන් හැඳින්විය හැකිය. මේවාට මූලාශ්‍රය වී ඇත්තේ සම්මිතිය නිකායට අයත් මහාසම්පිණ්ඩිකනිදාන නමැති පාලි ග්‍රන්ථය හා මහාවස්තු අපදානය ආදි කෘතීන්ය. එමෙන් ම ග්‍රන්ථ දෙකෙහි විද්‍යමාන පරිදි එකම ජාතකය හැඳින්වීම සඳහා යොදා ගන්නා ලද නාමයන්හි වෙනස්කම් දක්නට ලැබේ. ඒවා පහත පරිදි දැක්වේ.

| පාලි ජාතකට්ඨකථාව | ජාතකමාලාව |
|---|---|
| කදිරංග ජාතකය | ශ්‍රේෂ්ඨී ජාතකය |
| කුලාවක ජාතකය | ශක්‍ර ජාතකය |
| සීලවිමංස ජාතකය | බ්‍රාහ්මණ ජාතකය |
| මහා නාරද කස්සප ජාතකය | බ්‍රහ්ම ජාතකය |

ජාතකට්ඨකතාවේ අන්තර්ගත මුනික ජාතකයේ හා සාලුක ජාතකයේ කථාවස්තුව සමානය. එහෙත් එකිනෙකට වෙනත් යථෝක්ත නාම භාවිතයෙන් ඒවා දෙතැනක දක්නට ලැබෙත්. එපරිදි ම මච්ඡ ජාතකය යන නාමයෙන් ජාතක කථා දෙකක් ම දක්නට ලැබුණ ද ඒවායෙහි කථාවස්තුව එකිනෙකට අසමාන වූ ලක්ෂණයන්ගෙන් සමන්විතය. එසේ ම ශ්‍රේෂ්ඨී, අවිසහ්‍ය ශ්‍රේෂ්ඨී, හා ශ්‍රේෂ්ඨී ජාතකය යනුවෙන් ජාතකමාලාවෙහි ජාතක 03ක් අන්තර්ගත වුව ද ඒවායෙහි ඇතුළත් කථාවස්තූන් එකිනෙකට වෙනස්ය. මහා කපි ජාතකය නමින් ද ජාතක 02ක් දක්නට ලැබේ. එසේ වුව ද එම ජාතකයන්හි කථාවස්තූන්ගේ අන්තර්ගතය දෙයාකාරය.

ජාතකට්ඨකථාව එහි සරල බව සහ සාකල්‍යභාවය පදනම්ව විශේෂයෙන් ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය වැනි රටවල සමස්ත ආසියාතික බෞද්ධ සංස්කෘතියේ පොදු ජන විඥානය හැඩගැස්වීමට සමත්විය. තදනන්තරව ආර්යශූරයන්ගේ ජාතකමාලාව වනාහි එහි තිබෙන ඉහළ කාව්‍යමය ගුණය හේතුවෙන් ලෝක සාහිත්‍යයේ නොමැකෙන සලකුණක් තැබූ ග්‍රන්ථයක් වශයෙන් අජන්තා ලෙන් සිතුවම් වැනි ශ්‍රේෂ්ඨ බෞද්ධ කලා නිර්මාණ රැසකට මුල්බිම සැපයීය. එබැවින් මෙම කෘති ද්විත්වය ම බෞද්ධ සාහිත්‍යයේ විවිධත්වය සහ ප්‍රභාස්වර බව කියාපාන අමිල දායාදයන් දෙකක් වශයෙන් හැඳින්විය හැකිය.

## නිගමනය

පාලි ජාතකට්ඨකථාව සහ සංස්කෘත ජාතකමාලාව යනු බෞද්ධ සාහිත්‍ය නමැති වෘක්ෂයෙන් පැන නැඟුණු අග්‍රගණ්‍ය ශාඛා දෙකකි. කථාවස්තු සහ පාරමිතා ධර්ම නිරූපණය ආදියෙන් මේවා අතර දැඩි සමානකමක් පවතින මුත්, භාෂා භාවිතය, දර්ශනය, පාඨක ප්‍රජාව සහ සාහිත්‍යමය ශෛලිය කරණ කොටගෙන එකිනෙකට වෙනස් අනන්‍යතාවන් ප්‍රකට කරයි. ථේරවාද සම්ප්‍රදායේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයන්ගෙන් සමලංකෘතව ගොඩ නැඟුණු මෙම කෘතිද්වය මාවත් දෙකක් ඔස්සේ භාෂා දෙකක් මුල් කරගෙන රචනා වුව ද කතුවරුන් සතු අරමුණ වූයේ බෝසතුන්ගේ මාහැඟි ගුණ සමුදාය ලොවට විදහා දැක්වීම බව යථෝක්ත කාරණා ආශ්‍රයෙන් සනාථ වේ.

**ප්‍රමුඛ පද** - ජාතකට්ඨකථාව, ජාතකමාලාව, ථේරවාද සම්ප්‍රදාය, මහායාන සම්ප්‍රදාය, දශ පාරමිතා

## ආශ්‍රිත ග්‍රන්ථ

ජිනානන්ද හිමි, කෙරමිණියේ. (පරි.), (1951). *මංගල ව්‍යාඛ්‍යාන සහිත ජාතකමාලා.* කොළඹ: ඇස්. කේ. ඒ. ඩී. සිල්වා.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2003). *පාලි සාහිත්‍යයේ ඉතිහාසය.* කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2005). *පාලි සාහිත්‍යය.* කොළඹ 10: රත්න පොත් ප්‍රකාශකයෝ. ලොකුලියන,

ලොකුලියන, ලයනල්. (පරි.), (1960). *ජාතකට්ඨකථා අපණ්ණකසීලවග්ගදීපිකා.* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Haksar, A.N.D. (2015). *Jatakamala: Stories from the Buddha's Previous Births*. New Delhi: HarperCollins India.

Khoroche, P. (1989). *Once the Buddha Was a Monkey: Ārya Śūra's Jātakamālā.* Chicago: University of Chicago Press.

Kawasaki, K. and Kawasaki, V. (2010). *Jataka Tales of the Buddha,* 3 Vols. Kandy: Buddhist Publication Society.